# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2123/14 - 2019 මැයි මස 13 වැනි සඳුදා - 2019.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

එල්.ඩී.බී 3/2006

**2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත**

මූල්‍ය බුද්ධි ඒකකය විසින්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති.

මූල්‍ය බුද්ධි ඒකකය.

2019 මැයි මස 13 දින
කොළඹ දී ය.

රීති

1. මේ රීති 2019 අංක 1 දරන රක්ෂණකරුවන් (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ රීති (මෙහි මින්මතු "රක්ෂණකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කරගෙන යන -

(අ) ප්‍රාරක්ෂණය හා රක්ෂණයේ තැබීමේ; සහ
(ආ) අනුයෝජිතයන් හා තැරැව්කරුවන් විසින් රක්ෂණයට මැදිහත් වීමේ,

නියැලී සිටින සෑම ආයතනයකට ම අදාළ විය යුතු ය.

3. සෑම රක්ෂණකරුවකු විසින් ම, තම ගනුදෙනුකරුවන් වෙතින් යොමුවන මුදල් විශුද්ධිකරණ අවදානම් සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම් හඳුනාගැනීමේ, තක්සේරු කිරීමේ හා කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා අවදානම මත පදනම් වූ පිවිසුම මත පිහිටා, (මෙහි මින්මතු "නිසි උද්යෝගය" යනුවෙන් සඳහන් කරනු ලබන) නිරන්තරයෙන් ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම මගින්, මේ රීතිවල නිශ්චිතව සඳහන් කරනු ලබන පියවර ගනු ලැබිය යුතු ය.

1A - G 30055 — 20 (2019/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

### *මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම කළමනාකරණය කිරීම*

4. අවදානම කළමනාකරණය කිරීමේ කර්තව්‍යවල තීව්‍රබව සහ පෘථුලබව ''අවදානම මත පදනම් වූ පිවිසුමට'' අනුකූල විය යුතු අතර රක්ෂණකරුගේ ක්‍රියාකාරකම් සහ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම පිළිබඳ රක්ෂණකරුගේ අවදානම් සටහන් පැතිකඩවල ස්වභාවය, තත්ත්වය සහ සංකීර්ණබවට සමානුපාතික විය යුතු ය.

5. සෑම රක්ෂණකරුවකු ම ස්වකීය ගනුදෙනුකරුවන්ට, රටවලට හෝ භූගෝලීය ප්‍රදේශවලට, නිෂ්පාදනවලට, සේවාවලට, ගනුදෙනුවලට සහ බෙදාහැරීමේ මාර්ගවලට අදාළව ස්වකීය මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම පිළිබඳ අවදානම් හඳුනාගැනීමට, තක්සේරු කිරීමට සහ කළමනාකරණය කිරීමට සුදුසු පියවර ගත යුතු ය.

6. සෑම රක්ෂණකරුවකු විසින් ම මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම් තක්සේරු කිරීමේ දී පහත දැක්වෙන ක්‍රියාවලි අනුගමනය කරනු ලැබිය යුතු යː-

(අ) ස්වකීය අවදානම් තක්සේරු කිරීම් සහ අනාවරණය කිරීම් ලේඛනගත කිරීම;

(ආ) සමස්ත අවදානම් මට්ටම සහ අදාළ වන අවදානම් මට්ටම ද සහ අවදානම අවම කිරීමේ ස්වභාවය ද තීරණය කිරීමට පෙරාතුව, සියලු අදාළ අවදානම් සාධක සැලකිල්ලට ගැනීම;

(ඇ) වරින් වර සිදුකරන සමාලෝචන මගින් යාවත්කාලීන තක්සේරු කිරීමක් පවත්වාගෙන යාම; සහ

(ඈ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත අවදානම් තක්සේරු කිරීමේ තොරතුරු සැපයීම සඳහා යෝග්‍ය යාන්ත්‍රණ පවත්වාගෙන යාම.

7. සෑම රක්ෂණකරුවකු වෙතම පහත සඳහන් කරුණු ඇතුළත් ව යෝග්‍ය අවදානම් පාලනය කිරීමේ සහ අවම කිරීමේ ක්‍රමවේද තිබිය යුතු ය ː-

(අ) හඳුනාගෙන ඇති මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර ප්‍රතිපත්ති, පාලනය කිරීම් සහ කාර්ය පටිපාටි පවත්වාගෙන යාම ;

(ආ) එම ප්‍රතිපත්ති, පාලනය කිරීම් සහ කාර්ය පටිපාටි ක්‍රියාත්මක කරන ආකාරය, නියාමනය කිරීම සහ අවශ්‍ය වේ නම් ඒවා ප්‍රවර්ධනය කිරීම ; සහ

(ඇ) අවදානම මත පදනම් වූ පිවිසුම මත පිහිටා අවදානම් කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා යෝග්‍ය පියවර ගැනීම.

8. සෑම රක්ෂණකරුවකු විසින් ම පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිල්ලක් දක්වමින් ස්වකීය ගනුදෙනුකරුවන් පිළිබඳව අවදානම් පැතිකඩ සැකසීම පවත්වාගෙන යා යුතු ය ː-

(අ) ගනුදෙනුකාර පන්තියට අනුව අවදානම් මට්ටම (උදාː- නේවාසික හෝ අනේවාසික, කලින් කල හෝ එක්වරක් පමණක් වන, නෛතික තැනැත්තන්, දේශපාලන වශයෙන් හෙළිදරව් වූ තැනැත්තන් සහ විවිධ රැකියාවල නිරත ගනුදෙනුකරුවන් වැනි විවිධ ප්‍රභේදවල ගනුදෙනුකරුවන්);

(ආ) ගනුදෙනුකරුගේ ව්‍යාපාරයේ භූගෝලීය පිහිටීම හෝ ගනුදෙනුකරුගේ උපන් රට;

(ඇ) ගනුදෙනුකරුගේ නිෂ්පාදන, සේවා, ගනුදෙනු හෝ බෙදාහැරීමේ මාර්ග (උදාː- මුදල් පදනම් වූ, සම්මුඛ හෝ ප්‍රතිමුඛ දේශසීමාව හරහා); සහ

(ඈ) ගනුදෙනුකරුට අදාළ වෙනත් යම් තොරතුරු.

9. සෑම රක්ෂණකරුවකු විසින් ම ක්‍රියාත්මක කරනු ලබන අවදානම් පාලනය කිරීමේ සහ අවම කිරීමේ පියවර අවදානම මත පදනම් වූ පිවිසුම මත පිහිටා හඳුනාගෙන ඇති පරිදි, යම් නිශ්චිත ගනුදෙනුකරුවකුගේ අවදානම් පැතිකඩ සමග අනුරූප විය යුතු ය.

10. ගනුදෙනුකරුවෙක් වශයෙන් ආරම්භකව පිළිගැනීමෙන් පසුව, සෑම රක්ෂණකරුවකු විසින් ම එම ගනුදෙනුකරුගේ මුදල් විශුද්ධිකරණ අවදානමේ සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානමේ මට්ටම මත පිහිටා ඔහුගේ අවදානම් පැතිකඩ නිරන්තරයෙන් අධීක්ෂණය කර යාවත්කාලීන කරනු ලැබිය යුතු ය.

11. රක්ෂණකරුගේ මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම කළමනාකරණය කිරීම, රක්ෂණකරුට අදාළ සමස්ත අවදානම් කළමනාකරණය සමග අනුබද්ධ කිරීම සහ ඒකාබද්ධ කිරීම කරනු ලැබිය යුතු ය.

12. සෑම රක්ෂණකරුවකු විසින් ම එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත රක්ෂණකරුගේ අවදානම් තක්සේරුව, මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම් පැතිකඩ සහ අවදානම් පාලනය සහ අවම කිරීමේ ක්‍රමවේදවල කාර්යක්ෂමභාවය පිළිබඳ කාලීන වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. වාර්තා කිරීමේ වාර ගණන ආයතනය මුහුණ දී සිටින අවදානම් මට්ටම් සහ ආයතනය ක්‍රියාත්මක වන පරිසරය සමග අනුරූප විය යුතු ය.

13. 12 වන රීතියේ සඳහන් වාර්තාවේ පහත දැක්වෙන කරුණු අන්තර්ගත විය යුතු ය :-

(අ) මුදල් විශුද්ධිකරණ අවදානමට හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානමට එරෙහිව කටයුතු කිරීම සඳහා රක්ෂණකරු විසින් පවත්වාගෙන යනු ලබන නියාමන කටයුතුවල ප්‍රතිඵල (උදා:- මුදල් විශුද්ධිකරණ අවදානමට හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානමට රක්ෂණකරු විවෘත වී ඇති මට්ටම, මූලික කටයුතු හෝ ගනුදෙනුකාර කාණ්ඩය මත පදනම්ව මුදල් විශුද්ධිකරණ අවදානමට හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානමට විවෘත වන ආකාරය වෙන් කොට දැක්වීම, පනත ප්‍රකාරව සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීමට සහ ගනුදෙනු වාර්තා කිරීමේ සීමාවට යටත් වූ වාර්තා ඉදිරිපත් කිරීමට ඇති වූ ප්‍රවණතා, එක්සත් ජාතීන්ගේ ආරක්ෂණ මණ්ඩලයේ සම්මත යෝජනා යටතේ වූ අධිකරණමය තීන්දු ප්‍රකාශ සහ ක්‍රියාවිරහිත කිරීමේ කටයුතු);

(ආ) අභ්‍යන්තර හෝ බාහිර වශයෙන් මෑතකාලීනව මුහුණ දුන් වැදගත් අවදානම් පිළිබඳ විස්තර, ක්‍රියාකිරීමේ ක්‍රමවේදය සහ රක්ෂණකරු කෙරෙහි එහි බලපෑම හෝ අපේක්ෂිත බලපෑම; සහ

(ඇ) මුදල් විශුද්ධිකරණයට එරෙහිව වූ හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ ලිඛිත නීතිවල මෑතකාලීන වැඩි දියුණු කිරීම් සහ එයින් රක්ෂණකරුට ගම්‍ය වන බලපෑම.

**අභ්‍යන්තර පාලන ක්‍රම, ප්‍රතිපත්ති, අනුකූලතා, විගණනය සහ පුහුණු**

14. (1) සෑම රක්ෂණකරුවකු විසින් ම මුදල් විශුද්ධිකරණයට එරෙහිව සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ තත්කාලීනව බලපවත්නා ලිඛිත නීතිවලට යටත්ව, ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අභ්‍යන්තර ප්‍රතිපත්තියක් සකස් කරනු ලැබිය යුතු ය.

(2) විස්තරාත්මක කාර්යපටිපාටි සහ පාලන ක්‍රම සෑම රක්ෂණකරුවකු විසින් ම එම ප්‍රතිපත්තියට අනුකූලව වැඩි දියුණු කරනු ලැබිය යුතු ය.

15. එම ප්‍රතිපත්ති, කාර්යපටිපාටි සහ පාලන ක්‍රමවලට අවදානම් තක්සේරු කාර්ය පටිපාටි, නිසි උද්යෝගයට අදාළ පියවර, වාර්තා තබා ගැනීමේ ආකාරය, වාර්තා කිරීමේ සීමාවට යටත් වූ ගනුදෙනු වාර්තා කිරීම් කාර්ය පටිපාටි, අසාමාන්‍ය සහ සැක කටයුතු ගනුදෙනු අනාවරණය කර ගැනීමේ සහ අභ්‍යන්තර ලෙස වාර්තා කිරීමේ කාර්ය පටිපාටිය සහ මූල්‍ය බුද්ධි ඒකකය වෙත සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීමේ වගකීම ඇතුළත් වේ.

16. සෑම රක්ෂණකරුවකු විසින් ම ප්‍රතිපත්ති, කාර්ය පටිපාටි සහ පාලන ක්‍රම සකස් කිරීමේ දී නව හෝ සංවර්ධනය වෙමින් පවතින තාක්ෂණය භාවිත කිරීමේ දී උපචිත විය හැකි විශේෂයෙන්ම නිර්නාමික හෝ නිසි උද්යෝගයට අදාළ පියවරවල ප්‍රධාන ප්‍රතිපත්ති සමග අනනුකූල වන ගතිලක්ෂණ ඇති මුදල් විශුද්ධිකරණ අවදානම් හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම් පිළිබඳව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

17. සෑම රක්ෂණකරුවකු විසින් ම -

(අ) පනතේ සහ මේ රීතිවල සඳහන් නියම කිරීම්වලට අනුකූලව රක්ෂණකරුවකු ක්‍රියා කරනු ලබන බවට තහවුරු කිරීම සඳහා අනුකූලතා නිලධරයා වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධරයකු පත්කරනු ලැබිය යුතු ය;

(ආ) අනුකූලතා නිලධරයාට හෝ ඔහුට සහාය ලබාදීම සඳහා බලය පවරා ඇති වෙනත් යම් තැනැත්තකුට හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාකරනු ලබන තැනැත්තකුට ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමට අවශ්‍ය විය හැකි සියලු ගනුදෙනුකාර වාර්තා සහ වෙනත් අදාළ තොරතුරු වෙත කඩිනමින් ප්‍රවේශවීමේ හැකියාව ඇති බවට වගබලාගත යුතු ය;

(ඇ) සියලු ස්ථිර, කොන්ත්‍රාත් පදනම යටතේ වූ හෝ බාහිර සේවානියුක්තිකයන් බඳවා ගැනීමේ දී හෝ කුලියට ගැනීමේ අවස්ථාවේ දී, කළ යුතු සේවා නියුක්තයන් පිළිබඳ නිසි උද්යෝගයක් දැක්වීමේ සහ පිරික්සුම් කිරීමේ පරිපූර්ණ කාර්ය පටිපාටියක් ප්‍රවර්ධනය කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය;

(ඈ) පනත සහ ඒ යටතේ සාදන ලද නියෝග සහ මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම් කළමනාකරණයට අදාළ අභ්‍යන්තර ප්‍රතිපත්ති මෙන්ම කාර්ය පටිපාටි සක්‍රීය ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළුව අදාළ සේවානියුක්තිකයන් සඳහා යෝග්‍ය පුහුණු වැඩසටහන් නිරන්තරයෙන් සැලසුම්කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය; සහ

(ඉ) ප්‍රමාණවත් සම්පත් සහිත සහ රක්ෂණකරුගේ අභ්‍යන්තර ප්‍රතිපත්ති, කාර්ය පටිපාටි සහ පාලන ක්‍රම මෙන්ම පනත සහ ඒ යටතේ සාදන ලද නියෝග සමඟ එකඟව කාර්යක්ෂමව ක්‍රියාකිරීමේ හැකියාව නිතිපතා තක්සේරු කිරීමට හැකියාව ඇති බව තහවුරු කිරීම සඳහා ස්වාධීන විගණන කර්තව්‍යයක් පවත්වාගෙන යා යුතු ය.

**විදේශ ශාඛා සහ පාලිත සමාගම්**

18. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීමේ ක්‍රියාකාරකම්වලට එරෙහිව කටයුතු කිරීමේ අරමුණින් යුතු ව රක්ෂණකරුවන්ගෙන් සමන්විත මූල්‍ය සමූහ ව්‍යාපාරවල සියලු ශාඛා සහ බහුතර හිමිකාරත්ව පාලිත සමාගම් සඳහා අදාළ වන්නා වූ සහ යෝග්‍ය වන්නා වූ ද සාමූහිකව අදාළ වන්නා වූ ද, වැඩසටහන්, මූල්‍ය සමූහ සමාගම් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර 17 වන රීතියේ සඳහන් පියවරවලට අතිරේකව ඒ සඳහා පහත දැක්වෙන පියවර ඇතුළත් විය යුතු ය :-

(අ) නිසි උද්යෝගය සහ මුදල් විශුද්ධිකරණ අවදානම මෙන්ම ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය තොරතුරු සාමූහිකව ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර සහ කාර්ය පටිපාටි ආරම්භ කිරීම;

(ආ) මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල දී, මූල්‍ය සමූහ ව්‍යාපාරයේ සියලු ශාඛා සහ පාලිත සමාගම්වලින් ලබාගත් ගනුදෙනුකරුවන්ගේ, රක්ෂණ ඔප්පුවල සහ ගනුදෙනුවල මෙන්ම විගණනයන් පිළිබඳ තොරතුරු සමූහ මට්ටමේ අනුකූලතාවයකින් යුතු ව සැපයීම; සහ

(ඇ) මූල්‍ය සමූහ ව්‍යාපාරයේ ශාඛා සහ පාලිත සමාගම් අතර හුවමාරු වන තොරතුරුවල රහස්‍යභාවය සහ එම තොරතුරු භාවිත කිරීම පිළිබඳ ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන පවත්වාගෙන යාම.

19. දේශීය නීතියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට වඩා අදාළ විදේශීය රටෙහි අදාළ ලිඛිත නීති මගින් දැඩි බවින් අඩු විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක දී, දේශීය නීතියේ අවශ්‍යතා සමග අනුකූල වන්නා වූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පියවර ස්වකීය විදේශීය ශාඛා සහ බහුතර - හිමිකාරත්ව පාලිත සමාගම් විසින් අදාළ කර ගනු ලබන බවට සෑම රක්ෂණකරුවකු ම වගබලා ගත යුතු ය.

20. විදේශීය රට විසින් දේශීය නීති අවශ්‍යතාවලට එකඟව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පියවර නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවසර දෙනු නොලබන අවස්ථාවක දී, සෑම රක්ෂණකරුවකු විසින් ම මුදල් විශුද්ධිකරණ අවදානම හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය අතිරේක පියවර අදාළ කර ගනු ලැබිය යුතු ය.

**නව තාක්ෂණය භාවිත කිරීම**

21. නව නිෂ්පාදන සහ පෙර පැවති නිෂ්පාදන සඳහා, නව බෙදාහැරීමේ යාන්ත්‍රණ සහ නව හෝ වැඩි දියුණු වෙමින් පවතින තාක්ෂණය භාවිත කිරීම ද ඇතුළුව, අලුත් නිෂ්පාදන සහ අලුත් ව්‍යාපාර පරිචයන් වැඩි දියුණු කිරීමට අදාළව උපචිත වන මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම සෑම රක්ෂණකරුවකු විසින් ම හඳුනාගෙන තක්සේරු කරනු ලැබිය යුතු ය.

22. සෑම රක්ෂණකරුවකු විසින් ම -

(අ) නව නිෂ්පාදන, පරිචයන් සහ තාක්ෂණ ක්‍රම ආරම්භ කිරීමට හෝ භාවිත කිරීමට පෙරාතුව, අවදානම් තක්සේරු කිරීම් කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) නව නිෂ්පාදන සහ නව ව්‍යාපාර පරිචයන් ප්‍රවර්ධනයට අදාළව උපචිත විය හැකි අවදානම් කළමනාකරණය සහ අවම කිරීම සඳහා උචිත පියවර ගනු ලැබිය යුතු ය.

## II වන කොටස

## ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම (නිසි උද්යෝගය)

**සාමාන්‍ය නිසි උද්යෝගය**

23. (1) පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, කිසිදු රක්ෂණකරුවකු විසින් කිසිදු නිර්නාමික රක්ෂණ ඔප්පුවක්, අසත්‍ය නමකින් වූ රක්ෂණ ඔප්පුවක් හෝ ව්‍යාජ තැනැත්තකුගේ නමින් රක්ෂණ ඔප්පුවක් හෝ (මෙහි මින්මතු "අංකිත රක්ෂණ ඔප්පුවක්" යනුවෙන් සඳහන් කරනු ලබන) අංකයක් මගින් පමණක් හඳුන්වනු ලබන රක්ෂණ ඔප්පුවක් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(2) අංකිත රක්ෂණ ඔප්පුවක් යන්නට, රක්ෂණකරුගේ දැනුවත්භාවයෙන් තොරව හිමිකාරත්වය පැවරිය හැකි රක්ෂණ ඔප්පුවක් සහ රක්ෂණ ඔප්පුහිමියාගේ නම බැහැර කරමින් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සිදුකළ හැකි රක්ෂණ ඔප්පුවක් ඇතුළත් වේ.

24. (1) යම් රක්ෂණකරුවකු නියෝජිතයකු හරහා ගනුදෙනුකරුවකු සමග ව්‍යාපාර සම්බන්ධතාවකට ඇතුළත් වන අවස්ථාවක දී එම නියෝජිතයා නිසි උද්යෝගය සම්බන්ධයෙන් මෙම රීතිවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු බවට එම රක්ෂණකරු විසින් නියම කරනු ලැබිය යුතුය.

(2) නිසි උද්යෝගය ක්‍රියාත්මක කිරීමේදී නියෝජිතයන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාදාමයන් සහ ඊට අනුකූලව ක්‍රියා නොකරන අවස්ථාවක දී බලාත්මක කිරීමට හැකි නිසි ක්‍රියාමාර්ගද එම රක්ෂණකරු විසින් නියෝජිතයන් සමග ඇති කරගන්නා ගිවිසුමේ සඳහන් කළ යුතුය.

25. සෑම රක්ෂණකරුවකු විසින් ම පහත දැක්වෙන අවස්ථාවල දී, මේ රීතිවල නිශ්චිතව දක්වා ඇති නිසි උද්යෝගය පිළිබඳ පියවර ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු ය :-

(අ) ව්‍යාපාරික සම්බන්ධතාවලට ඇතුළත් වීමේ දී;

(ආ) මුදල් ප්‍රමාණය කුමක් වුවත් එය නොතකා, ඒ ගනුදෙනුකරු මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ කටයුතුවල යෙදී සිටින බවට රක්ෂණකරු වෙත යම් සැකයක් ඇති වූ විට දී;

(ඇ) පූර්වයෙන් ලබාගත් තොරතුරුවල සත්‍යභාවය හෝ ප්‍රමාණවත් බව පිළිබඳව රක්ෂණකරු වෙත යම් සැකයක් ඇති වූ විට දී.

26. සෑම රක්ෂණකරුවකු විසින් ම -

(අ) ව්‍යාපාර සම්බන්ධතාවලට ඇතුළත්වීමට පෙරාතුව, ස්වකීය ගනුදෙනුකරුවන් හඳුනාගත යුතු ය;

(ආ) මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු ලබාගෙන, අදාළ වන පරිදි එම තොරතුරු තහවුරු කරගෙන, අවම වශයෙන් එම තොරතුරු හඳුනාගැනීමේ කාර්ය සඳහා සහ ආරම්භක අවදානම් පැතිකඩ සකස් කිරීමේ කාර්යය සඳහා වාර්තා ගත කරනු ලැබිය යුතු ය;

(ඇ) නිසි උද්යෝගය අනුගමනය කිරීමේ කාර්ය සඳහා අවම වශයෙන් පහත දැක්වෙන තොරතුරු ලබාගත යුතු ය:-

(i) ගනුදෙනුවේ අරමුණ;
(ii) අරමුදල්වල ප්‍රභවය;
(iii) අපේක්ෂිත මාසික පිරිවැටුම;
(iv) අපේක්ෂිත ගනුදෙනු ක්‍රම (උදා:- මුදල්, චෙක්පත් යනාදිය);
(v) ප්‍රතිපාර්ශ්වවල අපේක්ෂිත ප්‍රභේද (අදාළ වේ නම්).

(ඈ) ගනුදෙනුකරු වෙනුවෙන් ක්‍රියාකිරීමට උද්දේශිත යම් තැනැත්තකුට එසේ බලය තිබේ ද යන්න තහවුරු කරගෙන ඒ තැනැත්තා හඳුනාගත යුතු අතර ඒ තැනැත්තාගේ අනන්‍යතාවය සත්‍යායනය කළ යුතු ය;

(ඉ) ප්‍රතිලාභී හිමිකරු හඳුනාගෙන, විශ්වසනීය ප්‍රභවයන්ගෙන් ලබාගත් රක්ෂණකරු සෑහීමකට පත්වන තොරතුරු සහ දත්ත භාවිත කරමින් ප්‍රතිලාභී හිමිකරුගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමට සාධාරණ පියවර ගත යුතු ය;

(ඊ) නිසි උද්යෝගය පැවැත්වීමේ කාර්ය සඳහා ප්‍රතිලාභියා හඳුනාගෙන පහත දැක්වෙන තොරතුරු ලබා ගත යුතු ය:-

(i) විශේෂයෙන් නම් කරන ලද ස්වභාවික හෝ නෛතික තැනැත්තන් හෝ නෛතික වැඩ පිළිවෙළ ලෙස හඳුනාගෙන ඇත්තා වූ ප්‍රතිලාභියකු සම්බන්ධයෙන් තැනැත්තාගේ නම ලබා ගත යුතු ය;

(ii) ගති ලක්ෂණ හෝ ප්‍රභේදය හෝ වෙනත් ක්‍රමයක් මගින් නම් කරනු ලබන ප්‍රතිලාභීන් (උදාඃ අන්තිම කැමති පත්‍රයක් හෝ තෙස්තමේන්තුවක් යටතේ) සම්බන්ධයෙන් - ගෙවා නිම කිරීමේ අවස්ථාවේ ප්‍රතිලාභියාගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමට හැකියාවක් ඇති බවට රක්ෂණකරු සෑහීමකට පත් විය හැකි පරිදි අදාළ ප්‍රමාණවත් තොරතුරු ලබා ගත යුතු ය; සහ

(iii) (i) වන සහ (ii) වන අනු ඡේදවල සඳහන් ප්‍රතිලාභියකු සම්බන්ධයෙන් වන විට, ප්‍රතිලාභියාගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම ගෙවා නිම කිරීම සිදු කරන අවස්ථාවේ දී සිදු කළ යුතු ය.

27. සෑම රක්ෂණකරුවකු විසින් ම, ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවර අදාළ කර ගනු ලැබිය යුතු ද යන්න පිළිබඳව තීරණය කිරීමේ දී, අදාළ අවදානම් සාධකයක් වශයෙන් ප්‍රතිලාභියාගේ තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු ය. නෛතික තැනැත්තකු හෝ නෛතික වැඩපිළිවෙළක් වන්නා වූ යම් ප්‍රතිලාභියකු වෙත වඩාත් ඉහළ අවදානමක් පවතින බවට රක්ෂණකරු විසින් නිශ්චය කරනු ලබයි නම් එම රක්ෂණකරු විසින් ගෙවා නිම කිරීමේ අවස්ථාවේ දී ප්‍රතිලාභී අයිතිකරුගේ අනන්‍යතාවය හඳුනාගැනීම සහ තහවුරු කර ගැනීම සඳහා සාධාරණ යාන්ත්‍රණ ඇතුළත් වන්නා වූ ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවර ගනු ලැබිය යුතු ය

**තහවුරු කිරීම කවර කාල පරාස තුළදී කළ යුතුද යන්න**

28. සෑම රක්ෂණකරුවකු විසින් ම ගනුදෙනුකරුවකු සමග ව්‍යාපාරික සම්බන්ධතාවක් ඇති කර ගැනීමට පෙර හෝ ව්‍යාපාරික සම්බන්ධතාවක් ඇති කර ගන්නා අතරතුර දී ගනුදෙනුකරුගේ සහ ප්‍රතිලාභී හිමිකරුගේ අනන්‍යතාවය තහවුරු කර ගත යුතු ය:

එසේ වුව ද, ගනුදෙනුකරුගේ අවදානම් මට්ටම රක්ෂණකරුගේ අවදානම් පැතිකඩට අනුව පහළ මට්ටමක පවතින්නේ නම් සහ ව්‍යාපාර සම්බන්ධතාවට ඇතුළත් වන අවස්ථාවේ දී තහවුරු කර ගැනීම සිදුකළ නොහැකි නම්, රක්ෂණකරු විසින්, 29 වන රීතියට යටත්ව, ව්‍යාපාර සම්බන්ධතාවට ඇතුළත්වීමෙන් පසුව අදාළ ලේඛන සපයන ලෙස ස්වකීය ගනුදෙනුකරු සහ ප්‍රතිලාභී හිමිකරුට අවසර දෙනු ලැබිය හැකි අතර (මෙහි මින්මතු "ප්‍රමාද වූ තහවුරු කර ගැනීම" යනුවෙන් සඳහන් කරනු ලබන) තහවුරු කර ගැනීම පසුව සම්පූර්ණ කරනු ලැබිය හැකි ය.

29. ප්‍රමාද වූ තහවුරු කර ගැනීමක් සඳහා අවසර දෙනු ලබන ඕනෑම අවස්ථාවක දී, පහත දැක්වෙන කොන්දේසි සපුරාලනු ලැබිය යුතු ය :-

(අ) තහවුරු කර ගැනීම ප්‍රායෝගිකව හැකි ඉක්මණින් එහෙත් ව්‍යාපාර සම්බන්ධතාවලට ඇතුළත් වීමේ දින සිට වැඩ කරන දින දාහතරකට වැඩි නොවන කාලයක් තුළ සම්පූර්ණ කළ යුතු ය;

(ආ) රක්ෂණකරුගේ සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම්වලට අවහිර නොවන පරිදි, ප්‍රමාදය අවශ්‍ය විය යුතු ය; සහ

(ඇ) මුදල් විශුද්ධිකරණ අවදානමක් හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානමක් පිළිබඳ සැකයක් නොපැවතිය යුතු ය.

30. ප්‍රමාද වූ තහවුරු කර ගැනීමක් පිළිබඳ අවදානම අවම කිරීම සඳහා තහවුරු කිරීමට පෙරාතුව සෑම රක්ෂණකරුවකු විසින් ම, ගනුදෙනුකරු විසින් ව්‍යාපාරික සම්බන්ධතාවය ප්‍රයෝජනයට ගනු ලබනුයේ යම් කොන්දේසි යටතේ ද එම කොන්දේසිවලට අදාළ අවදානම් කළමනාකරණ කාර්ය පටිපාටි අනනුගමනය කරනු ලැබිය යුතු ය.

31. යම් රක්ෂණකරුවකු අදාළ නිසි උද්යෝගය පිළිබඳ පියවරවලට අනුකූලව ක්‍රියාකිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, එවැනි රක්ෂණකරුවකු විසින් -

(අ) නව ගනුදෙනුකරුවකු සම්බන්ධයෙන් වනවිට, ව්‍යාපාරික සම්බන්ධතාවකට ඇතුළුවීම හෝ ගනුදෙනුවක් සිදු කිරීම නොකළ යුතු ය; නැතහොත්

(ආ) වත්මන් ගනුදෙනුකරුවකු සම්බන්ධයෙන් වන විට, එම ගනුදෙනුකරු සමග ව්‍යාපාරික සම්බන්ධතාවය අවසන් කර ඒ ගනුදෙනුකරුට අදාළ සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් සකස් කිරීම පිළිබඳ සලකා බැලිය යුතු ය.

**ප්‍රවර්ධිත නිසි උද්යෝගය**

32. සෑම රක්ෂණකරුවකු විසින් ම, ගනුදෙනුකරුවකු සඳහා තක්සේරු කරන ලද මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම වැඩි අවදානමක් ලෙස ගණනය කරනු ලැබ ඇති අවස්ථාවක දී, 26 වන රීතියේ නිශ්චිතව දක්වා ඇති පියවරවලට අමතරව පහත දැක්වෙන ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවර ගනු ලැබිය යුතු යඃ-

(අ) ගනුදෙනුකරු සහ ප්‍රතිලාභී හිමිකරු පිළිබඳව අමතර තොරතුරු ලබා ගැනීම (උදාඃ- වත්කම් ප්‍රමාණය සහ පොදු දත්ත සමුදායන්ගෙන් ලබාගත් වෙනත් තොරතුරු);

(ආ) ගනුදෙනුකරු සමඟ එම ව්‍යාපාරික සම්බන්ධතාව ඇති කර ගැනීමට පෙර හෝ වත්මන් ගනුදෙනුකරුවකු සමඟ අඛණ්ඩව එවැනි ව්‍යාපාරික සම්බන්ධතාවක් පවත්වාගෙන යාමට පෙර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයක් දරන්නන් සිටී නම්, එම කළමනාකාරීත්වයේ අනුමැතිය ලබා ගැනීම;

(ඇ) ඇති කර ගැනීමට අදහස් කරන ව්‍යාපාරික සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳව අමතර තොරතුරු ලබා ගැනීම;

(ඈ) ගනුදෙනුකරු සහ ප්‍රතිලාභී හිමිකරු හඳුනාගැනීමේ දත්ත නිතිපතා යථාවත් කිරීම; සහ

(ඉ) අපේක්ෂිත හෝ සිදුකරන ලද ගනුදෙනු පිළිබඳ හේතු විමසා වාර්තා තැබීම.

33. කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ, ගනුදෙනුකරුගේ සහ ප්‍රතිලාභී හිමිකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමට පෙරාතුව, කිසිදු රක්ෂණකරුවකු විසින් ඉහළ මූල්‍ය විශුද්ධිකරණ අවදානමක් සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානමක් සහිත ගනුදෙනුකරුවකු සමඟ ව්‍යාපාරික සම්බන්ධතාවක් ඇති කර ගැනීම හෝ කිසිදු ගනුදෙනුවක් සිදුකිරීම නොකළ යුතු ය.

**නිරන්තර නිසි උද්යෝගය**

34. සෑම රක්ෂණකරුවකු විසින් ම, ස්වකීය ගනුදෙනුකරුවන් සමඟ නොකඩවා පවත්වනු ලබන යම් ව්‍යාපාරික සම්බන්ධතාවක් මත -

(අ) ඒ සම්බන්ධතාව පවතින අතරතුර කරනු ලබන ගනුදෙනු රක්ෂණකරුගේ දැනුවත්භාවයට අනුකූල වන්නේ ද යන්න තහවුරු කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී අරමුදල් මූලාශ්‍ර ද ඇතුළුව ගනුදෙනු, ගනුදෙනුකරු, ඔවුන්ගේ ව්‍යාපාර සහ අවදානම් පැතිකඩ සම්බන්ධයෙන් සියුම් නිරීක්ෂණයෙන් කටයුතු කිරීම මගින්;

(ආ) පවතින වාර්තාවල සමාලෝචනයක් සිදු කිරීම මගින්, විශේෂයෙන් 48 වන රීතියේ සඳහන් ඉහළ අවදානමක් ඇති රටවල ගනුදෙනුකරුවන් සඳහා නිසි උද්යෝගය පිළිබඳ කාර්ය පටිපාටිය යටතේ රැස්කරන ලේඛන, දත්ත හෝ තොරතුරු යාවත්කාලීනව සහ අදාළ වන පරිදි තබා ගැනීමට වග බලා ගැනීමෙන්; සහ

(ඇ) (i) අසාමාන්‍ය බව පෙනී යන;
(ii) ගනුදෙනුවේ ප්‍රමාණය හා සංසන්දනය කරන විට අපේක්ෂිත ක්‍රියාකාරකම් වර්ගය සහ ව්‍යාපාර මාදිලිය සමඟ අනුකූල වන;
(iii) කිසිදු විද්‍යාමාන ආර්ථික අරමුණක් නොමැති; හෝ
(iv) විශේෂයෙන් සංකීර්ණ සහ විශාල ගනුදෙනුවක් හෝ ගනුදෙනුවලට හෝ ඉහළ අවදානමක් ඇති ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් ඒ ගනුදෙනුවල නීත්‍යානුකූලභාවය පිළිබඳ සැකයක් උපදවන්නා වූ,

යම් ගනුදෙනුවක හෝ ව්‍යාපාරික සම්බන්ධතාවක ආර්ථික පසුබිම සහ අරමුණ සැලකිල්ලට ගැනීමෙන්, පනතේ 5 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, නිරන්තර නිසි උද්යෝගයෙන් සහ සියුම් නිරීක්ෂණයෙන් කටයුතු කළ යුතු ය.

35. ගනුදෙනුකරුවන් පිළිබඳ උද්යෝගයෙන් හෝ ප්‍රවර්ධිත නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ යුතු වාර ගණන, අවදානම් පැතිකඩ සහ ගනුදෙනුවේ ස්වභාවය මත පදනම් වී ගනුදෙනුකරුගෙන් යොමුවන මුදල් විශුද්ධිකරණ අවදානමේ මට්ටම සමග සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම් මට්ටමට සමානුපාතික විය යුතු ය.

36. සෑම රක්ෂණකරුවකු විසින්ම, ප්‍රවර්ධිත නිරන්තර නිසි උද්යෝගය ක්‍රියාත්මක කිරීමේ දී යොදනු ලබන පාලන ක්‍රම සංඛ්‍යාව සහ කාල පරාසය වැඩි කිරීම සිදු කළ යුතු අතර ඉදිරි පරීක්ෂණ අවශ්‍ය වන රටාවක වූ ගනුදෙනු තෝරා ගැනීම සිදු කළ යුතු ය.

**වත්මන් ගනුදෙනුකරුවන්**

37. සෑම රක්ෂණකරුවකු විසින් වත්මන් ගනුදෙනුකරුවකුගේ වැදගත්කම සහ අවදානම පිළිබඳව සැලකිල්ලට ගෙන, ස්වකීය වත්මන් ගනුදෙනුකරුවන් සඳහා නිසි උද්යෝගය පිළිබඳ පියවර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. වත්මන් ගනුදෙනුකරුගේ වැදගත්කම සහ අවදානම තක්සේරු කිරීමේ දී, සෑම රක්ෂණකරුවකු විසින් ම පහත දැක්වෙන කරුණු පිළිබඳ සලකා බැලිය යුතු ය :-

(අ) ගනුදෙනුවේ වැදගත්කම ඇතුළුව, ගනුදෙනුවේ ස්වභාවය සහ ගනුදෙනුවේ පරිබාහිර අවස්ථානුගත කරුණු;

(ආ) රක්ෂණ ඔප්පුවේ හෝ ව්‍යාපාරික සම්බන්ධතාවය ක්‍රියාත්මක වන ආකාරයේ යම් වැදගත් වෙනස්වීමක්; හෝ

(ඇ) ගනුදෙනුකරු සම්බන්ධයෙන් දරනු ලබන තොරතුරු ප්‍රමාණවත් නොවීම හෝ ගනුදෙනුකරුගේ තොරතුරු වෙනස්වීම.

38. පහත දැක්වෙන අවස්ථාවල දී කලින් ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ යම් රක්ෂණකරුවකු විසින් තවදුරටත් වූ තහවුරු කිරීමක් කරනු නොලැබිය හැකි ය :-

(අ) රක්ෂණ ඔප්පුවේ නියම සහ කොන්දේසි සඳහා (රක්ෂණ ඔප්පුව යටතේ වූ ප්‍රතිලාභ ඇතුළුව) කිසිදු සැලකිය යුතු වෙනස්කමක් නොකර රක්ෂණ ඔප්පු අලුත්කිරීම සහ නැවත රක්ෂණය කිරීම;

(ආ) රෝහල් සහ ශල්‍යකර්ම රක්ෂණය සහ බරපතල රෝගාබාධ රක්ෂණය ඇතුළුව පවාරන අගය ගෙවීම් කිරීම සඳහා ප්‍රතිපාදන සලසනු නොලබන දීර්ඝ කාලීන රක්ෂණ ආවරණ ඉල්ලීම්.

39. යම් වත්මන් ගනුදෙනුකරුවකු විසින් නිසි උද්යෝගය පිළිබඳ පියවරවලට අදාළව සෑහීමට පත්විය නොහැකි තොරතුරු සපයනු ලබන අවස්ථාවක දී, එවැනි ගනුදෙනුකරුවකු සමග පවතින සම්බන්ධතාවය ඉහළ අවදානමක් දරන ගනුදෙනුකාර සම්බන්ධතාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවර සඳහා යටත් විය යුතු ය.

40. යම් ගනුදෙනුකරුවකු සම්බන්ධයෙන් මුදල් විශුද්ධිකරණ අවදානමක් හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානමක් පිළිබඳව රක්ෂණකරුවකුට යම් සැකයක් ඇතිවන අවස්ථාවක දී, නිසි උද්යෝගය පිළිබඳ පියවර අනුගමනය කිරීම මගින් ගනුදෙනුකරු වෙත හෝඩුවාවක් ලැබෙන බවට සාධාරණ ලෙස විශ්වාස කළ හැකි අවස්ථාවක දී, රක්ෂණකරු විසින් නිසි උද්යෝගය පිළිබඳ පියවර අනුගමනය කිරීම අවසන් කර ගනුදෙනුව ඉදිරියට ගෙනගොස් වහාම සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් ගොනු කරනු ලැබිය යුතු ය.

**නෛතික තැනැත්තන් සහ නෛතික වැඩ පිළිවෙල සඳහා වූ නිසි උද්යෝගය**

41. නෛතික තැනැත්තකු හෝ නෛතික වැඩපිළිවෙලක් සම්බන්ධයෙන් වන විට, සෑම රක්ෂණකරුවකු විසින් ම -

(අ) ගනුදෙනුකරුගේ ව්‍යාපාරයේ ස්වභාවය, එහි හිමිකාරත්වය සහ පාලන ව්‍යුහය පිළිබඳ අවබෝධ කර ගනු ලැබිය යුතු ය;

(ආ) මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා ප්‍රකාරව ගනුදෙනුකරු හඳුනාගෙන තහවුරු කර ගනු ලැබිය යුතු ය.

42. නෛතික තැනැත්තකුගේ අත්‍යන්ත පාලන හිමිකාරත්ව සම්බන්ධතාව සහිත ස්වභාවික තැනැත්තකු සිටීනම්, එම තැනැත්තා හඳුනාගැනීමේ අරමුණින්, රක්ෂණකරු විසින්, අවම වශයෙන් පහත දැක්වෙන විස්තර ලබාගෙන තහවුරු කර ගැනීම සඳහා සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය :-

(අ) සියලු අධ්‍යක්ෂවරුන් සහ සියයට දහයකට වැඩි ස්කන්ධ ප්‍රාග්ධන සම්බන්ධතාවක් සහිත සියලු කොටස් හිමියන් හඳුනාගෙන එවැනි අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන්ගේ යම් වෙනසක් වූ විට දැනුම් දෙන ලෙස නෛතික තැනැත්තා වෙත නියම කරනු ලැබිය යුතු ය;

(ආ) පාලන හිමිකාරත්ව සම්බන්ධතාව සහිත තැනැත්තා ප්‍රතිලාභී හිමිකරු වේ ද යන්න පිළිබඳ සැකයක් ඇතිවන අවස්ථාවක දී හෝ හිමිකාරත්ව සම්බන්ධතාවය හරහා පාලනය කරනු ලබන ස්වාභාවික තැනැත්තකු නොමැති අවස්ථාවක දී, නෛතික තැනැත්තාගේ පාලනය හෝ නෛතික වැඩ පිළිවෙළෙහි පාලනය ස්වාධීන මූලාශ්‍ර හරහා ක්‍රියාත්මක කරනු ලබන ස්වාභාවික තැනැත්තකු සිටී නම් ඒ තැනැත්තාගේ අනන්‍යතාවය තහවුරු කරගත යුතු ය;

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයක් මගින් හෝ අන්‍යාකාරයකින් නෛතික පුද්ගලයා නියෝජනය කිරීම සඳහා යම් තැනැත්තකු වෙත ලබාදුන් බලය පැවරීම තහවුරු කර ගත යුතු ය;

(ඈ) ඉහතින් වූ විධිවිධාන යටතේ කිසිදු ස්වාභාවික තැනැත්තකු හඳුනාගත නොහැකි වන අවස්ථාවක දී, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තත්ත්වය දරන අදාළ ස්වාභාවික තැනැත්තන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත යුතු ය; සහ

(ඉ) නෛතික තැනැත්තකුගේ පාලන සම්බන්ධතාවය වෙනත් නෛතික තැනැත්තකු සතු කර ඇති අවස්ථාවක දී, රක්ෂණකරු විසින් එම නෛතික තැනැත්තා පාලනය කරනු ලබන ස්වාභාවික තැනැත්තාගේ අනන්‍යතාවය තහවුරු කරගනු ලැබිය යුතු ය.

43. නෛතික වැඩපිළිවෙලක ප්‍රතිලාභී හිමිකරුවන් හඳුනාගැනීම සඳහා රක්ෂණකරු විසින් පහත දැක්වෙන විස්තර ලබාගෙන තහවුරු කර ගැනීම සඳහා සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය :-

(අ) භාර සඳහා, භාරයේ නිර්මාතෘගේ අනන්‍යතාවය, භාරකරුවන්ගේ, ප්‍රතිලාභියාගේ හෝ ප්‍රතිලාභී පන්තියේ අනන්‍යතාවයන් සහ භාරයේ අත්‍යන්ත සක්‍රීය පාලනය ක්‍රියාත්මක කරනු ලබන වෙනත් යම් තැනැත්තකුගේ අනන්‍යතාව (පාලන ජාලයක් හරහා හෝ හිමිකාරත්ව ජාලයක් හරහා පාලනය කරන තැනැත්තන් ඇතුළුව); හෝ

(ආ) වෙනත් ආකාරයේ නෛතික වැඩපිළිවෙල සඳහා සමාන හෝ සම තත්ත්වයේ තැනැත්තන්ගේ අනන්‍යතාවය.

44. ප්‍රතිලාභීන්ගේ ලක්ෂණ හෝ ප්‍රතිලාභී පන්තියක් මගින් ප්‍රතිලාභීන් නම් කරනු ලබන භාරවල ප්‍රතිලාභීන්ගේ ප්‍රමාණවත් තොරතුරු ගෙවීම් නිම කරන අවස්ථාවේ දී හෝ හිමිකමක් ඉල්ලීම සඳහා ඔවුන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කරන අවස්ථාවේ දී රක්ෂණකරු විසින් ලබා ගත යුතු ය.

**රාජ්‍ය නොවන සංවිධාන, ලාභ නොලබන සංවිධාන හෝ පුන්‍ය ආයතන**

45. (මෙහි මින් මතු "එන්.ජී.ඕ." යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය නොවන සංවිධානයක්, (මෙහි මින් මතු "එන්.පී.ඕ." යනුවෙන් සඳහන් කරනු ලබන) ලාභ නොලබන සංවිධානයක් සහ පුන්‍ය ආයතනයක් සමග ව්‍යාපාරික සම්බන්ධතාවකට එළඹීමේ දී, ඒ එන්.ජී.ඕ., එන්.පී.ඕ. සහ පුන්‍ය ආයතනවල රක්ෂණ ඔප්පු නීත්‍යනුකූල කාර්ය සඳහා භාවිත කරනු ලබන බවට සහ ගනුදෙනු කටයුතු ප්‍රකාශිත අරමුණු හා කාර්යය සමග අනුරූප වන බවට වග බලා ගැනීම සඳහා සෑම මූල්‍ය ආයතනයක් විසින් ම, ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවර අනුගමනය කරනු ලැබිය යුතු ය.

46. (1) අදාළ එන්.ජී.ඕ., එන්.පී.ඕ. හෝ පුන්‍ය ආයතනයේ සංස්ථාපනය කිරීමේ ලේඛනවල ලබා දී ඇති අභිධානයට අනුව, ඒ එන්.ජී.ඕ., එන්.පී.ඕ. හෝ පුන්‍ය ආයතනයේ නමින් සෑම රක්ෂණකරුවකු විසින් ම ගනුදෙනු සිදු කරනු ලැබිය යුතු ය.

(2) රක්ෂණ ඔප්පු ක්‍රියාත්මක කිරීම සඳහා බලය පවරා ඇති පුද්ගලයන් සහ ඔවුන්ගේ පාලක මණ්ඩලවල සාමාජිකයන් එම ප්‍රවර්ධිත පියවරවලට යටත් විය යුතු ය.

(3) (2) වන ඡේදයේ සඳහන් තැනැත්තන් එම නම යටතේ හෝ වෙනත් නමක් යටතේ තහනම් කළ අස්ථිත්වයක් හෝ තැනැත්තකු සමග සම්බන්ධ වී නොසිටින බවට සෑම රක්ෂණකරුවකු විසින් ම වගබලාගත යුතු ය.

47. (1) තහනම් කරන ලද අස්ථිත්වයක් හෝ තැනැත්තකු වශයෙන් නම් කළ, යම් අස්ථිත්වයක් හෝ තැනැත්තකු සමඟ එන්.ජී.ඕ., එන්.පී.ඕ. හෝ පුන්‍ය ආයතනයක් ඒවායේ බලයලත් අත්සන්කරුවන්, ඒවායේ පාලක මණ්ඩලවල සාමාජිකයන් සහ ප්‍රතිලාභී හිමිකරුවන් සම්බන්ධතා නොපවත්වන බවට වගබලා ගැනීම සඳහා, එන්.ජී.ඕ., එන්.පී.ඕ. හෝ පුන්‍ය ආයතනයක සියලු වත්මන් සම්බන්ධතා සෑම රක්ෂණකරුවකු විසින් ම සමාලෝචනය කර නියාමනය කරනු ලැබිය යුතු ය.

(2) නම්වල ඇති සමානකමක් නිසා යම් සැකයක් ඇතිවන අවස්ථාවක දී, රක්ෂණකරු විසින් සැක කටයුතු ගනුදෙනු පිළිබඳ වාර්තාවක් ගොනුකිරීම හෝ වෙනත් නෛතික පියවරක් ගැනීම හෝ එම ක්‍රියාමාර්ග දෙකම ගැනීම සිදුකළ යුතු ය.

**ඉහළ අවදානම් සහිත රටවල ගනුදෙනුකරුවන්**

48. (1) ඉහළ අවදානම් සහිත රටවල ගනුදෙනුකරුවන් සමඟ ව්‍යාපාරික සම්බන්ධතා සහ ගනුදෙනු සඳහා සෑම රක්ෂණකරුවකු විසින් ම ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවර අදාළ කරගනු ලැබිය යුතු ය.

(2) විදේශ කටයුතු විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා, මූල්‍ය බුද්ධි ඒකකය විසින්-

(අ) මූල්‍ය කාර්ය සාධක බලකායේ ලැයිස්තුගත කිරීම් මත පදනම්ව; හෝ

(ආ) මුදල් විශුද්ධිකරණයට එරෙහිවීමේ ප්‍රතිපත්ති සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායවල ඌනතා පැවතීම සහ එම ඌනතා සඳහා ප්‍රතිකර්ම සැලසීමේ ප්‍රමාණවත් ප්‍රගතියක් නොපැවතීම සැලකිල්ලට ගෙන, ස්වාධීනව,

(1) වන ඡේදයේ සඳහන් ඉහළ අවදානම් සහිත රටවල්වල ලැයිස්තුව එහි නිල වෙබ් අඩවියේ පළ කළ යුතු ය.

49. ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවරවලට අතිරේකව, ලැයිස්තුගත කරන ලද ඉහළ අවදානම් සහිත රටවල අවදානමේ ස්වභාවයට අනුරූපව, 48 වන රීතියේ (2) වන ඡේදයේ සඳහන් ඉහළ අවදානම් සහිත රටවල් පිළිබඳ ලැයිස්තුවේ නිශ්චිතව දක්වා ඇති රටවල් සඳහා සෑම රක්ෂණකරුවකු විසින් ම පහත දැක්වෙන පරිදි යෝග්‍ය ප්‍රතිපියවර අදාළ කර ගනු ලැබිය යුතු ය :-

(අ) හඳුනාගත් රටවල් හෝ අදාළ රටෙහි පදිංචි තැනැත්තන් සමග ව්‍යාපාර සම්බන්ධතා හෝ මූල්‍ය ගනුදෙනු සීමා කිරීම; සහ

(ආ) මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් පියවර ගැනීම.

**දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන්**

50. (1) සෑම රක්ෂණකරුවකු විසින් ම ගනුදෙනුකරු හෝ ප්‍රතිලාභී හිමිකරු දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තකු ද යන්න තීරණය කිරීම සඳහා යෝග්‍ය අභ්‍යන්තර ප්‍රතිපත්ති, කාර්ය පටිපාටි සහ පාලන ක්‍රම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) ගනුදෙනුකරු හෝ ප්‍රතිලාභී හිමිකරු දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තකු හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සහ සමීප ආශ්‍රිතයන් වන අවස්ථාවක දී, සෑම රක්ෂණකරුවකු විසින් ම -

(අ) ව්‍යාපාර සම්බන්ධතා සඳහා ඇතුළත්වීමට හෝ ව්‍යාපාර සම්බන්ධතා අඛණ්ඩව පවත්වාගෙන යාමට රක්ෂණකරුගේ පාලක මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගත යුතු ය;

(ආ) අරමුදල්වල සහ සම්පත්වල මූලාශ්‍ර යෝග්‍ය ක්‍රම මගින් තහවුරු කිරීම සිදුකළ යුතු ය; සහ

(ඇ) රක්ෂණකරු සමග පවතින ඔවුන්ගේ ව්‍යාපාර සම්බන්ධතා මත ප්‍රවර්ධිත නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම සහ අඛණ්ඩව නියාමනය කිරීම සිදුකළ යුතු ය.

**තුන්වන පාර්ශවය මත විශ්වාසය තැබීම**

51. රක්ෂණකරුවකු විසින්, නිසි උද්යෝගය පිළිබඳ පියවර ක්‍රියාත්මක කිරීමේ දී, රක්ෂණකරු විසින් ම එසේ කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, ගනුදෙනුකරු හඳුනාගැනීම, ප්‍රතිලාභී හිමිකරු හඳුනාගැනීම, ව්‍යාපාරයේ ස්වභාවය තේරුම් ගැනීම හෝ ව්‍යාපාරය ආරම්භ කිරීම ඇතුළුව, නිසි උද්යෝගය පිළිබඳ පියවර ක්‍රියාත්මක කිරීමේ දී තුන්වන පාර්ශවයක් වන මූල්‍ය ආයතනයක් හෝ නමෝද්දිෂ්ඨ මූල්‍ය නොවන ව්‍යාපාරයක් මත රඳා පැවතීමට හැකි ය.

52. යම් රක්ෂණකරුවකු, නිසි උද්යෝගය පිළිබඳ පියවර ක්‍රියාත්මක කිරීමට තුන්වන පාර්ශවයක් වන මූල්‍ය ආයතනයක් හෝ නමෝද්දිෂ්ඨ මූල්‍ය නොවන ව්‍යාපාරයක් මත රඳා පවතින අවස්ථාවක දී, තුන්වන පාර්ශවය මත රඳා පවතින්නා වූ රක්ෂණකරු මත නිසි උද්යෝගය පිළිබඳ පරම වගකීම පැවතිය යුතු අතර, ඒ රක්ෂණකරු විසින් -

(අ) නිසි උද්යෝගය පිළිබඳ පියවරවලට අදාළ අවශ්‍ය තොරතුරු වහාම ලබාගැනීම කරනු ලැබිය යුතු ය;

(ආ) ඉල්ලීමක් කිරීමෙන් පසුව, ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයෙන් නිසි උද්යෝගය පිළිබඳ අවශ්‍යතාවලට අදාළ හඳුනාගැනීමේ දත්ත සහ වෙනත් අදාළ ලේඛනවල පිටපත් ලබාගැනීමේ හැකියාව පිළිබඳ සෑහීමකට පත්වන පරිදි පියවර ගනු ලැබීම කළ යුතු ය;

(ඇ) තුන්වන පාර්ශවය විධිමත් කර ඇති බවට, අධීක්ෂණය කර ඇති බවට හෝ නියාමනය කර ඇති බවට ද, පනතට අනුව සහ ඒ යටතේ සාදනු ලබන රීතිවලට අනුව නිසි උද්යෝගය ක්‍රියාත්මක කිරීමට සහ වාර්තා තබාගැනීමේ අවශ්‍යතාවයන්ට අනුකූලව ක්‍රියා කිරීමට පියවර පවතින බවට සෑහීමට පත්වීම කරනු ලැබිය යුතු ය.

53. තුන්වන පාර්ශවයන් මත රඳා පවතින්නා වූ සෑම රක්ෂණකරුවකු වෙතම -

(අ) මුදල් විශුද්ධිකරණයට එරෙහිවීමේ සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්තිවල ක්‍රමෝපාය ඌනතා පවතින රටවල් වශයෙන් මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් හඳුනාගෙන ඇති රටවල් ද ඇතුළුව, ජාත්‍යන්තර මූල්‍ය පද්ධතිය කෙරෙහි ඇති මුදල් විශුද්ධිකරණ අවදානම හෝ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීමේ අවදානම අවම කිරීමට හැකියාව සහිත අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි තිබිය යුතු ය;

(ආ) රඳා පැවතීමට බලාපොරොත්තු වන තුන්වන පාර්ශවයක රට නිශ්චය කිරීමේ දී, රටෙහි අවදානම් මට්ටම පිළිබඳ පවතින තොරතුරු පිළිබඳ සලකා බැලිය යුතු ය.

## III වන කොටස

### *වාර්තා තැබීම*

54. සෑම රක්ෂණකරුවකු විසින් ම, ගනුදෙනුවලට අදාළ වන්නා වූ ද, විශේෂයෙන් නිසි උද්යෝගය පිළිබඳ ක්‍රියාවලිය තුළ දී ලබාගත්තා වූ ද, යම් රක්ෂණ ඔප්පු, ව්‍යාපාරික ලිපි සහ ලේඛන ද ඇතුළුව, ගනුදෙනුකරුවන්ගේ සහ ප්‍රතිලාභී හිමිකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමට භාවිත කරන ලද ලේඛනවල සහ සිදු කරන ලද යම් විශ්ලේෂණයක ප්‍රතිඵලවල අදාළ වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

55. එසේ පවත්වාගෙන යනු ලබන වාර්තා යථාවත් කළ යුතු අතර මුල් පිටපත් වශයෙන් හෝ රක්ෂණකරුගේ පිටිසන සහිත පිටපත් වශයෙන් තබා ගත යුතු ය.

56. පනතේ දක්වා ඇති පරිදි සෑම රක්ෂණකරුවකු විසින්ම අදාළ වාර්තා අවම වශයෙන් වසර 6 පවත්වාගත යුතුවේ. යම් වාර්තාවක් සිදු වෙමින් පවතින විමර්ශනයකට හෝ නඩු පැවරීමකට යටත් වන අවස්ථාවක දී නැතහොත් නීතිය ක්‍රියාත්මක කරන අධිකරණයකට හෝ වෙනත් යෝග්‍ය අධිකාරියකට ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී, ඒ වාර්තා තවදුරටත් අවශ්‍ය නොවන බවට අදාළ අධිකාරිය විසින් රක්ෂණකරුට දැනුම් දෙනු ලබන තුරු රක්ෂණකරු විසින් ඒ වාර්තා තබා ගත යුතු ය.

57. සෑම රක්ෂණකරුවකු විසින් ම, අදාළ වර්තා, අධිකරණයක දී සාක්ෂියක් ලෙස ආවේශ්‍ය කර ගත හැකි සහ අධීක්ෂණ බලධාරීන්ට සහ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන්ට, ඒ අධිකාරීන් විසින් නිශ්චිතව සඳහන් කරන ලද කාල සීමාවන්ට අනුකූලවන අකාරයකින් ඒ වාර්තා ලබා ගත හැකි ආකෘතියකින් පවත්වාගෙන යා යුතු ය.

## IV වන කොටස

### *ගනුදෙනුකරු පරීක්ෂා කිරීම*

58. සෑම රක්ෂණකරුවකු විසින් ම ත්‍රස්තවාදය හා ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූලඝාතක අවි ව්‍යාප්තිය සහ ඊට මුදල් සැපයීම සම්බන්ධයෙන් ඉලක්කගත මූල්‍ය සම්බාධක පැනවීමට අදාළව 1968 අංක 45 දරන එකසත් ජාතීන්ගේ පනත අනුව

සාදන ලද යම් නියෝගයක් යටතේ නිකුත් කරන ලද නම් කළ තැනැත්තන්ගේ හෝ ආස්ථිත්‍යයන්ගේ ලැයිස්තුවක, යම් ගනුදෙනුකරුවකුගේ, අපේක්ෂිත ගනුදෙනුකරුවකුගේ හෝ ප්‍රතිලාභියකුගේ නම ඇතුළත්ව තිබේද යන්න හෝ එවන් යම් ගනුදෙනුකරුවකු, අපේක්ෂිත ගනුදෙනුකරුවකු හෝ ප්‍රතිලාභියකු, එම නම් කළ තැනැත්තන් හෝ ආස්ථිත්‍යයන් වෙනුවෙන් හෝ ඔවුන්ගේ විධානය යටතේ ක්‍රියා කරනු ලබන්නේ ද යන්න හෝ එම නම් කරන ලද තැනැත්තන්ගේ හෝ ආස්ථිත්‍යයන්ගේ ප්‍රතිලාභය වෙනුවෙන් ක්‍රියා කරනු ලබන්නේ ද යන්න තහවුරු කර ගනු ලැබිය යුතු ය.

59. මෙම රීතිවල -

"පනත" යන්නෙන් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත අදහස් වේ;

"ප්‍රතිලාභියා" යන්නෙන්, රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වන රක්ෂිත සිදුවීමක් සිදු වුවහොත් හෝ සිදු වූ විටක දී හෝ රක්ෂණ ඔප්පුවෙන් ලැබෙන මුදල් ගෙවනු ලබන ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු හෝ නෛතික වැඩ පිළිවෙලක් හෝ යම් ප්‍රභේදයක තැනැත්තන් අදහස් වේ;

"ප්‍රතිලාභී හිමිකරු" යන්නෙන් ගනුදෙනුකරුවකුගේ අත්‍යන්ත හිමිකාරත්වය හෝ පාලනය සහිත ස්වාභාවික තැනැත්තකු, නැතහොත් ගනුදෙනුව පවත්වනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා අදහස් වන අතර යම් තැනැත්තකුගේ හෝ නෛතික වැඩපිළිවෙලක සක්‍රීය ලෙස අත්‍යන්ත පාලනය දරනු ලබන තැනැත්තකු ද ඊට ඇතුළත් වේ;

"අධ්‍යක්ෂ මණ්ඩලය" යන්නෙන් රක්ෂණකරුවකුගේ පාලක මණ්ඩලය හෝ අධ්‍යක්ෂවරු සමූහය අදහස් වන අතර, ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කරන ලද රක්ෂණකරුවකු සම්බන්ධයෙන් වනවිට, එම රක්ෂණකරුගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව අධිකාරිය අදහස් වේ;

"ගනුදෙනුකරු" යන්නට, ගනුදෙනුවක් හෝ රක්ෂණ ඔප්පුවක සම්බන්ධයෙන් වන විට -

(අ) ගනුදෙනුවක් හෝ රක්ෂණ ඔප්පුවක් සකස් කිරීම, විවෘත කිරීම හෝ භාර ගැනීම කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ නමින් ද එවැනි තැනැත්තකු;

(ආ) යම් ගනුදෙනුවක හෝ රක්ෂණ ඔප්පුවක අත්සන්කරුවකු;

(ඇ) ගනුදෙනුවක් භාර දෙනු ලැබූ හෝ පවරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද එවැනි තැනැත්තකු; හෝ

(ඈ) ගනුදෙනුවක් පවත්වාගෙන යාම සඳහා බලය ලබා දී ඇති යම් තැනැත්තකු,"

ඇතුළත් වේ.

"සමීප ආශ්‍රිතයන්" යන්නට,

(අ) නෛතික ආස්ථිත්වවල සහ නෛතික වැඩපිළිවෙලවල හවුල් ප්‍රතිලාභී හිමිකාරිත්වය හෝ වෙනත් යම් සමීප ව්‍යාපාර සම්බන්ධතා සහිත ස්වාභාවික තැනැත්තකු; සහ

(ආ) ප්‍රතිලාභී හිමිකරු ස්වාභාවික තැනැත්තකු වන්නා වූ ද, එම තැනැත්තා හෝ ඔහුගේ පවුලේ සමීප සාමාජිකයන්ගේ ප්‍රතිලාභය වෙනුවෙන් සකස් කර ඇති බව දන්නා වූ ද යම් නෛතික තැනැත්තකු හෝ නෛතික වැඩපිළිවෙලක්,

ඇතුළත් වේ.

"වත්මන් ගනුදෙනුකරු" යන්නෙන් මෙම රීති බලාත්මක වන දින හෝ එදිනට පෙර ව්‍යාපාර සම්බන්ධතාවක් ආරම්භ කර ඇති ගනුදෙනුකරුවකු අදහස් වේ;

"මූල්‍ය කාර්ය සාධක බලකාය" යන්නෙන් මුදල් විශුද්ධිකරණයට, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට සහ සමූල ඝාතක අවි ආයුධ ව්‍යාප්තියට එරෙහිවීමේ ප්‍රතිපත්ති සංවර්ධනය සහ ප්‍රවර්ධනය කර ගෝලීය මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා වන ස්වාධීන අන්තර් රාජ්‍ය ආයතනයක් අදහස් වේ;

"මූල්‍ය සමූහ ව්‍යාපාරය" යන්නෙන් මුදල් විශුද්ධිකරණයට එරෙහිවීම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩ පැවැත්වීම යටතේ වන ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි අදාළ කර ගැනීම පිළිබඳව සාමූහිකව අධීක්ෂණය කිරීම සඳහා, සමූහ ව්‍යාපාරයේ සෙසු සමාගම් පාලනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම ඉටු කරනු ලබන පීතෘ සමාගමකින් හෝ වෙනත් යම් ආකාරයක නෛතික තැනැත්කුගෙන් සහ ඊට යටත් ශාඛා සහ පාලිත සමාගම්වලින් සමන්විත වන සමාගම් සමූහයක් අදහස් වේ;

"පවුලේ සමීප සාමාජිකයා" යන්නට කලත්‍රයා, දරුවන් සහ ඔවුන්ගේ කලත්‍රයන් හෝ සහකරුවන් හෝ සහකාරියන්, දෙමාපියන්, සහෝදර සහෝදරියන් සහ ඔවුන්ගේ කලත්‍රයන් සහ මුණුබුරු මිණිපිරියන් සහ ඔවුන්ගේ කලත්‍රයන් ඇතුළත් වේ;

"නෛතික තැනැත්තා" යන්නෙන් රක්ෂණකරුවකු සමග ස්ථිර ගනුදෙනුකාර සම්බන්ධතාවක් තහවුරු කිරීමට හැකියාව ඇති හෝ අන්‍යාකාරයකින් දේපළ අයත් වන යම් ස්වාභාවික තැනැත්තකු නොවන ආස්ථිත්වයක් අදහස් වන අතර, එයට සමාගමක්, සංස්ථාගත පුද්ගල මණ්ඩලයක්, පදනමක්, හවුල් ව්‍යාපාරයක් හෝ සංගමයක් අදහස් වේ;

"නෛතික වැඩපිළිවෙල" යන්නට ප්‍රකාශිත භාරයක් ඇතුළත් වේ;

"බහුතර කොටස් හිමි පාලිත සමාගම" යන්නෙන් කොටස්වලින් සියයට පනහක් හෝ වැඩි ප්‍රමාණයක් පීතෘ සමාගම විසින් දරනු ලබන සමූහ ව්‍යාපාරයක යම් පාලිත සමාගමක් අදහස් වේ;

"මුදල් විශුද්ධිකරණය" යන්නෙන් 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව මුදල් විශුද්ධිකරණ වරද අදහස් වේ;

"තැනැත්තා" යන්නෙන් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු අදහස් වන අතර එයට සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් සහ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද ශාඛාවක් ඇතුළත් වේ;

"දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තා" යන්නෙන් දේශීය වශයෙන් හෝ විදේශීය රාජ්‍යයක් විසින් හෝ ජාත්‍යන්තර සංවිධානයක් විසින් ප්‍රමුඛ රාජ්‍ය කර්තව්‍ය පවරා ඇති යම් පුද්ගලයකු අදහස් වන අතර එයට යම් රාජ්‍යයක හෝ රජයක ප්‍රධානියකු, දේශපාලනඥයකු, ජ්‍යෙෂ්ඨ රජයේ නිලධරයකු, අධිකරණ නිලධරයකු හෝ හමුදා නිලධරයකු හෝ රජය සතු සංස්ථාවක, රජයේ හෝ ස්වාධීන ආයතනයක ජ්‍යෙෂ්ඨ විධායක නිලධරයකු හෝ අදහස් වන අතර, මධ්‍යම මට්ටමේ හෝ කනිෂ්ඨ මට්ටමේ තැනැත්තන් ඊට ඇතුළත් නොවේ;

"අවදානම මත පදනම් වූ පිවිසුම" යන්නෙන් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා වූ නිසි උද්යෝගය පිළිබඳ පියවර අදාළ කර ගැනීම සම්බන්ධයෙන් වූ විට අඩු අවදානම් මට්ටමක් සහිත ගනුදෙනුකරුවන් සඳහා සරල කරන ලද නිසි උද්යෝගය පිළිබඳ පියවර භාවිත කිරීම සහ ඉහළ අවදානම් මට්ටමක් සහිත ගනුදෙනුකරුවන් සඳහා ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවර භාවිත කිරීම අදහස් වේ;

"සැක කටයුතු ගනුදෙනු වාර්තාව" යන්නෙන් පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව සැක කටයුතු ගනුදෙනුවක් හෝ එවැනි ගනුදෙනුවක් සඳහා තැත් කිරීමක් පිළිබඳ වාර්තාවක් අදහස් වේ;

"ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම" යන්නෙන් 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ වරදක් සංයුක්ත වන ක්‍රියාවක් අදහස් වේ;

"ගනුදෙනු වාර්තා කිරීමේ සීමාවට යටත් වූ වාර්තා" යන්නෙන් පනතේ 6 වන වගන්තිය යටතේ වාර්තාවක් අදහස් වේ.

**උපලේඛනය**

**(26 වන සහ 41 වන රීති)**

**(1) තනි පුද්ගල ගනුදෙනුකරුවන් :-**

(අ) පහත දැක්වෙන තොරතුරු ලබාගත යුතු යː-

(අ1) සියලු ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් වනවිට -

(i) හඳුනාගැනීමේ ලේඛනයේ සඳහන් වන පරිදි සම්පූර්ණ නම;

(ii) ගනුදෙනුකරුගේ ඡායාරූපය ඇතුළත් වන නිල පෞද්ගලික හැඳුනුම්පත හෝ වෙනත් යම් හඳුනාගැනීමේ ලේඛනයක් (උදාː- ජාතික හැඳුනුම්පත, වලංගු ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය);

(iii) හඳුනාගැනීමේ ලේඛනයේ සඳහන් වන පරිදි ස්ථිර ලිපිනය, පදිංචි ලිපිනය ස්ථිර ලිපිනයෙන් වෙනස් වන්නේ නම්, පදිංචි ලිපිනය මාස තුනකට වඩා පැරණි නොවන උපයෝගිතා බිල්පතක් ආධාරයෙන් හෝ වෙනත් යම් විශ්වසනීය මූලාශ්‍රයක් මගින් පදිංචිය සනාථ කරනු ලැබිය යුතු ය. උපයෝගිතා බිල්පත් ලෙස විදුලි බිල්පත, ජල බිල්පත සහ ස්ථාවර දුරකථන ක්‍රියාකරුවකුගේ බිල්පත වශයෙන් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය. රජයට අයිති ව්‍යවසායක් වෙනුවෙන් හැර කිසිදු තැපැල් පෙට්ටි අංකයක් භාර නොගත යුතු ය. "අයිතිකරු භාරයේ" යන්න සඳහන් කරන අවස්ථාවක දී, දේපළ අයිතිකරුගේ කැමැත්ත සහ වෙනත් අදාළ ලිපිනය තහවුරු කරන ලේඛන ලබා ගැනීම අවශ්‍ය වේ;

(iv) දුරකථන අංකය, ෆැක්සිමෙල් අංකය සහ ඊ-මේල් ලිපිනය (තිබේ නම්);

(v) උපන් දිනය;
(vi) ජාතිය;
(vii) රැකියාව, ව්‍යාපාරය, දරන තනතුර සහ සේවායෝජකයාගේ නම සහ අදාළ වන භූගෝලීය පසුබිම (අදාළ වන්නේ නම්);
(viii) රක්ෂණ ඔප්පුව ලබාගත්තේ කුමන කාර්යයක් සඳහා ද යන්න;
(ix) අපේක්ෂිත ව්‍යාපාර පිරිවැටුම/ ව්‍යාපාර ධාරිතාව;
(x) ගනුදෙනු කිරීමට අපේක්ෂිත ආකාරය;
(xi) ප්‍රමාණවත් සමුද්දේශ (අදාළ වේ නම්); සහ

(අ2) අනේවාසික ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් වනවිට -
(i) ශ්‍රී ලංකාවේ දී රක්ෂණ ඔප්පුව ලබා ගැනීමට හේතුව;
(ii) උපදෙස් ලබාදීම සඳහා බලය පවරා ඇති තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම, ලිපිනය සහ විදේශ ගමන් බලපත්‍රයේ පිටපත;

(ආ) පහත දැක්වෙන ලේඛන ලබාගත යුතු ය (එක් එක් පිටපත මුල් පිටපත සමඟ සසඳා තහවුරු කරනු ලැබිය යුතු ය):-
(i) හඳුනා ගැනීමේ ලේඛනයේ පිටපත;
(ii) ලිපිනය තහවුරු කිරීමේ ලේඛනවල පිටපත;
(iii) විජාතික ගනුදෙනුකරුවන්ගේ ගිණුම් සම්බන්ධයෙන් වනවිට, වලංගු වීසා බලපත්‍රයේ/ අවසර පත්‍රයේ පිටපත.

**(2) හිමිකාරත්ව/ හවුල් ව්‍යාපාර :-**

(අ) පහත දැක්වෙන තොරතුරු ලබා ගත යුතු යː-

(i) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ලේඛනයේ සඳහන් පරිදි හවුල්කරුවන්ගේ හෝ අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම්;
(ii) ව්‍යාපාරයේ ස්වභාවය;
(iii) ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලියාපදිංචි ලිපිනය ;
(iv) තනි පුද්ගල ගිණුම්වලට අදාළ වන පරිදි අයිතිකරුගේ/ හවුල්කරුවන්ගේ හඳුනාගැනීමේ විස්තර;
(v) සම්බන්ධ කරගත හැකි දුරකථන, ෆැක්ස් අංක;
(vi) අදායම් බදු ලිපිගොනු අංකය;
(vii) හිමිකාරත්ව පාලනයේ ප්‍රමාණය;
(viii) වෙනත් සම්බන්ධිත ව්‍යාපාර සම්බන්ධතා;

(ආ) පහත දැක්වෙන ලේඛන ලබාගත යුතු ය (එක් එක් පිටපත මුල් පිටපත සමග සසඳා තහවුරු කරනු ලැබිය යුතු ය):-
(i) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ලේඛනයේ පිටපත;
(ii) අයිතිකරුගේ තොරතුරු/ හවුල් ව්‍යාපාර ඔප්පුව;
(iii) හඳුනා ගැනීමේ ලේඛනයේ සහ ලිපිනය තහවුරු කිරීමේ ලේඛනවල පිටපත්;

**(3) සංස්ථා/ වගකීමෙන් සීමිත සමාගම් :-**

(අ) පහත දැක්වෙන තොරතුරු ලබාගත යුතු යː-

(i) ආයතනයේ ලියාපදිංචි නාමය සහ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය;
(ii) ව්‍යාපාරයේ ස්වභාවය සහ අරමුණ;
(iii) ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලියාපදිංචි ලිපිනය;
(iv) තැපැල් ලිපිනය (ඇත්නම්);
(v) දුරකථන/ ෆැක්ස්/ ඊමේල්;
(vi) ආදායම් බදු ලිපිගොනු අංකය;
(vii) බැංකු සමුද්දේශ (අදාළ වේ නම්);
(viii) තනි පුද්ගල ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් වන ආකාරයට, සියලු අධ්‍යක්ෂවරුන්ගේ අනන්‍යතාව;
(ix) සියයට දහයකට වැඩි ස්කන්ධ ප්‍රාග්ධන සම්බන්ධතාවක් ඇති ප්‍රධාන කොටස් හිමියන්ගේ ලැයිස්තුව;
(x) පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් ලැයිස්තුව;
(xi) අත්සන්කරුවන්ගේ නම් පිළිබඳ විස්තර;

සටහන : ප්‍රතිලාභී හිමිකාරත්වයේ ප්‍රමාණවත් විනිවිදභාවය සහතික කරමින් තොරතුරු හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවලට යටත්ව 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලබා දී ඇති ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපළේ ලැයිස්තුගත කර ඇති හෝ වෙනත් යම් කොටස් වෙළඳපළක ලැයිස්තුගත කර ඇති සමාගම් සම්බන්ධයෙන් වනවිට, අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කොටස් හිමියන් හඳුනාගැනීම සඳහා මූල්‍ය ආයතනය විසින් විශ්වසනීය මූලාශ්‍රවල සඳහන් වන තොරතුරු භාවිත කරනු ලැබිය හැකි ය;

(ආ) පහත දැක්වෙන ලේඛන ලබා ගත යුතු ය. (එක් එක් පිටපත එහි මුල් පිටපත සමග සසඳා තහවුරු කළ යුතු ය):-

(i) සංස්ථාගත කිරීමේ සහතිකයේ පිටපත;

(ii) (මෙහි මින්මතු "සමාගම් පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 40 වන ආකෘතියේ පිටපතක් (පවත්නා සමාගමක් ලියාපදිංචි කිරීම) හෝ 1 වන ආකෘතියේ පිටපතක් (සමාගමක් ලියාපදිංචි කිරීම) සහ සාංගමික ව්‍යවස්ථාවලියේ පිටපතක්;

(iii) රක්ෂණ ඔප්පුව ලබාගැනීම සඳහා බලය දෙනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය;

(iv) සමාගම් පනත යටතේ 20 වන ආකෘතියේ පිටපතක්; (අධ්‍යක්ෂවරුන්/ ලේකම් වෙනස්වීම සහ අධ්‍යක්ෂවරුන්/ ලේකම් පිළිබඳ විස්තර);

(v) සමාගම් පනත යටතේ 44 වන ආකෘතියේ පිටපතක් (ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කරනු ලැබූ සමාගමක සම්පූර්ණ ලියාපදිංචි ලිපිනය හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය සහ ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති එම සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය);

(vi) සමාගම් පනත යටතේ 45 වන ආකෘතියේ පිටපතක් (ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ව්‍යාපාරික ස්ථානයක් ඇති ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ ලැයිස්තුව සහ ඒ පිළිබඳ විස්තර);

(vii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත සමාගමක් නම්, ආයෝජන මණ්ඩල ගිවිසුමේ පිටපතක්;

(viii) අපනයන සංවර්ධන මණ්ඩලයේ අනුමත සමාගමක් නම්, අපනයන සංවර්ධන මණ්ඩල අනුමත ලිපියේ පිටපතක්;

(ix) පොදු නිල ලැයිස්තුගත සමාගමක් නම්, ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා වූ සහතිකයේ පිටපතක්;

(x) අවස්ථාවෝචිත පරිදි ඇටෝර්නි බලපත්‍රයේ හෝ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයේ පිටපතක් සමගින් ගනුදෙනු කිරීම සඳහා බලය දෙනු ලැබූ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම්;

(xi) ආසන්නතම විගණනය කරන ලද ගිණුම්, තිබේ නම්, එම ගිණුම්;

**(4) සමාජ ශාලා, සමිති, පුන්‍ය ආයතන, සංගම් සහ රාජ්‍ය නොවන සංවිධාන :-**

(අ) පහත දැක්වෙන තොරතුරු ලබාගත යුතු ය:-

(i) ආයතනයේ ලියාපදිංචි නම සහ ලියාපදිංචි අංකය;

(ii) අධිකාර පත්‍රය, ව්‍යවස්ථාව යනාදියේ සඳහන් පරිදි ලියාපදිංචි ලිපිනය;

(iii) තනි පුද්ගල ගිණුම්වලට අදාළ වන ආකාරයට, නිලධරයන්, අත්සන්කරුවන්, පරිපාලකයන් හෝ පාලන මණ්ඩලයේ හෝ කමිටුවේ සාමාජිකයන් හෝ අදාළ ආයතනයේ මෙහෙයුම් කටයුතු කෙරෙහි පාලනයක් හෝ බලපෑමක් කළහැකි වෙනත් තැනැත්තන් යටත් පිරිසෙයින් දෙදෙනකුගේ අනන්‍යතාව;

(iv) රක්ෂණ ඔප්පුව ලබාගැනීම සඳහා බලය දෙනු ලබන කමිටු හෝ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය;

(v) ආදායම්/ අරමුදල් මූලාශ්‍ර සහ මට්ටම්;

(vi) වෙනත් සම්බන්ධිත ආයතන/ ආශ්‍රිත සමාගම්/ සංවිධාන;

(vii) දුරකථන/ ෆැසිමේල් අංකය/ ඊ-මේල් ලිපිනය;

(ආ) පහත දැක්වෙන ලේඛන ලබාගත යුතු අතර මුල් ලේඛනය සමග සසඳා තහවුරු කර ගත යුතු ය:-

(i) ලියාපදිංචි ලේඛනය/ ව්‍යවස්ථාව අධිකාරී පත්‍රය යනාදියෙන් එකක පිටපතක් ;

(ii) රක්ෂණ ඔප්පුව ලබාගැනීම සඳහා බලය පවරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය;

(iii) ඇටෝර්නි බලපත්‍රයේ හෝ අධ්‍යක්ෂ මණ්ඩල/ කමිටු යෝජනා සම්මතයේ පිටපතක් සමග ගනුදෙනු සඳහා උපදෙස් ලබාදීමට බලය පවරනු ලැබ ඇති තැනැත්තන්ගේ නම්;

**(5) භාර නාමිකයන් :-**

(අ) පහත දැක්වෙන තොරතුරු ලබාගත යුතු ය:-

(i) තනි පුද්ගල ගිණුම්වලට අදාළ වන ආකාරයට, සියලු භාරකරුවන්ගේ, සමභාරකරුවන්ගේ, භාරයේ කර්තෘගේ සහ ප්‍රතිලාභීන්ගේ හඳුනාගැනීමේ විස්තර;

(ii) ගනුදෙනුකරු භාරකරුවකු, නාමිකයකු හෝ වෙනත් අතරමැදියකු ලෙස ක්‍රියාකරන්නකු ද යන්න;

(ආ) පහත දැක්වෙන ලේඛන ලබාගත යුතු ය. (එක් එක් පිටපත මුල් පිටපත සමග සසඳා තහවුරු කරගත යුතු ය) :-

(i) භාර ඔප්පුවේ පිටපත අදාළ වේ නම්;

(ii) සියලු තනි පුද්ගලයන් පිළිබඳ විස්තර.

05 - 714

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.